# සමාජ ශාලා බලපත්‍ර නිකුත්කිරීමේ ක්‍රියාවලිය



**20.1 හැඳින්වීම**

යම් සභා බල ප්‍රදේශයක පිහිටි සමාජ ශාලා එම ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි විය යුතුය.

**20.2 නෛතික අධිකාරිය**

1987 අංක 38 දරන පනත හා 1980 අංක 14 පනත් වලින් සංශෝධිත 1975 අංක 17 දරන සමාජ ශාලා බලපත්‍ර නිකුත්කිරීමේ නීතිය.

**20.3 සුදුසුකම්**

සභා බල ප්‍රදේශය තුළ දැනටමත් පවතින හෝ ආරම්භ කිරීමට සැලසුම් කොට ඇති සමාජ ශාලාවක් වීම.

**20.4 ගාස්තුව**

(අ) සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ඉල්ලුම් පත්‍ර ගාස්තුව හා බලපත්‍ර ගාස්තුව.

**20.5 ඉදිරිපත් කළ යුතු ලේඛන**

මෙහි ඇමුණුමෙහි දක්වා ඇති ඉල්ලුම් පත්‍රය සහ එමගින් ඉල්ලා ඇති ලේඛන

**20.6 ඉල්ලුම් කිරීමේ කාර්යය පටිපාටිය**

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | නියමිත ගාස්තුව ගෙවා ඉල්ලුම් පත්‍රයක් ලබා ගැනීම | | විෂයභාර නිලධාරියා |
| 2 | සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය පිටපත් තුනකින් යුක්තව ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීම | | අයදුම්කරු |
| 3 | ප්‍රාදේශීය ලේකම්ගේ වාර්තාව සමඟ වූ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය පිටපත් තුනකින් භාර ගැනීම | | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| 4 | ඉල්ලුම් පත්‍රයේ පිටපතක් බැගින් පහත සටහන අංක 1 හි තැනැත්තන් වෙත යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය ලැබී සති හතරක් ඇතුළත | සභාපති |
| 5 | පහත සටහන අංක 2 හි තොරතුරු සමඟ සති හතරක් ඇතුළත විරෝධතා ඇත්නම් ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට වූ දැන්වීමක් ගැසට් පත්‍රයේ පළ කිරීම | ඉල්ලුම් පත්‍රය ලැබී සති හතරක් ඇතුළත | සභාපති |
| 6 | විරෝධතා නොමැති නම් ලේඛනයේ සටහන් කර බලපත්‍රය නිකුත් කිරීම | | ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා |

සටහන: 1. පොලිස් අධිකාරි සහ සුරා බදු කොමසාරිස් ජනරාල් වෙත ද, සමාජ හා විනෝද කාර්යය සම්බන්ධයෙන් වන විට සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ද, සංස්කෘතික හෝ ආගමික කාර්යය සඳහා වන විට සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ වෙත ද, ක්‍රීඩා කටයුතු සඳහා වන විට ක්‍රීඩා අධ්‍යක්ෂ වෙත ද පිටපතක් බැගින් යොමු කළ යුතුය.

2. ගැසට් පත්‍රයේ පළ කළ යුතු තොරතුරු වන්නේ, ඉල්ලුම්කරුගේ නම, සමාජ ශාලාවේ නම සහ එය පවත්වා ගෙන යන ස්ථානය.

## 20.7 බලපත්‍රය නිකුත් කිරීම හෝ අලුත් කිරීම පිළිබඳ විරෝධතා ඇති විට කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | විරෝධතා ලැබී ඇති විට, ඒවායේ පිටපත් ඉල්ලුම්කරු වෙත භාර දීම | විරෝධතා ඉදිරිපත් කිරීමට දී ඇති කාලය අවසන් වූ විගස | සභාපති |
| 2 | විරෝධතා පරීක්ෂා කිරීම සහ ඒ පිළිබඳ තීරණය ගැනීම | විරෝධතා කාලය අවසන් වී දින 14 ක් ඇතුළත | සභාපති |
| 3 | විරෝධතා පිළිබඳ තීරණය ඉල්ලුම්කරු, පොලිස් අධිකාරි, සුරා බදු කොමසාරිස් හා වෙනත් විරෝධතාකරුවන් ඇත්නම් ඔවුන් වෙත දැන්වීම | විරෝධතා පරීක්ෂණ තීරණයේ දින සිට දින 07ක් ඇතුළත | සභාපති |
| 4 | සභාපතිගේ තීරණයෙන් තෘප්තිමත් නොවේ නම් විරෝධතාකරුවන් විසින් අමාත්‍යවරයාට අභියාචනා කිරීම | තීරණය ලැබුණු දින සිට දින 14ක් ගත වීමට පෙර | |
| 5 | අමාත්‍යවරයාගේ තීරණය ලැබීම හා ඒ අනුව කටයුතු කිරීම | | අමාත්‍යවරයා |